අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. EPD/Dis/01/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2022.09.02

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 29/2022

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පළාත්/කලාප පෙළපොත් විෂයභාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පරිවේණාධිපතිවරුන්,
රජයේ හා අනුමත පෞද්ගලික පාසල් විදුහල්පතිවරුන්,
පෙළපොත් මධ්‍යස්ථාන භාර නිලධාරීන්,
පෙළපොත් විෂය භාර ගුරුභවතුන්,

**පාසල් පෙළපොත් නැවත භාවිතය පුළුල් කිරීම**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සියලු ම රජයේ පාසල්, අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල අධ්‍යාපනය ලබන සිසුන්ට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් වර්ග 410කින් යුත් පෙළපොත් පිටපත් මිලියන 40කට ආසන්න ප්‍රමාණයක් නොමිලේ සැපයේ. 2022 වර්ෂයේ දී පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම සඳහා රජය විසින් දරන ලද වියදම රුපියල් මිලියන 4500 ඉක්මවයි.

02. විශාල මුදලක් වැය කර සම්පාදිත පෙළපොත්, නැවත භාවිතය සඳහා යෝග්‍ය වන පරිදි භාවිත කිරීමේ වගකීම සිසු දරුවන්ට පැවරෙන අතර ඒ සඳහා ඔවුන්ට මඟ පෙන්වීමේ වගකීම විදුහල්පතිවරුන්ට, ගුරු භවතුන්ට හා දෙමාපියන්ට පැවරේ. මෙලෙස පෙළපොත් හැකි උපරිම ප්‍රමාණයක් නැවත භාවිත කිරීමෙන් ඉතිරි වන මහජන මුදල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් වැය කිරීමට රජයට අවස්ථාව සැලසේ.

03. මේ නිසා සෑම වර්ෂයක ම භාවිත කළ වැඩපොත් හැර අනෙකුත් පෙළපොත් පහත වගුවේ දැක්වෙන ප්‍රතිශත ප්‍රමාණයන්ට අනුව නැවත භාවිත කිරීමට පියවර ගත යුතු ය. එහිදී තෙවන වාරය අවසන් වන විට නව පාසල් වාරයට නියමිත පෙළපොත් දරුවන්ට ලබා දිය යුතු බැවින් වාර විභාග කටයුතුවලට බාධා නොවන ආකාරයෙන් බෙදාදීම සඳහා පාසල විසින් සකස් කර ගත් සැලසුමකට අනුව, භාවිත කළ පෙළපොත් පාසල වෙත භාර ගත යුතු ය. ඒ සම්බන්ධයෙන් පහත 3.1හි නිර්ණායක අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ.

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

3.1 පෙළපොත් නැවත භාවිත කිරීමේ නිර්ණායක

| ශ්‍රේණිය | පෙළපොත් ආපසු ලබා ගැනීම | නැවත භාවිත ප්‍රතිශතය |
|---|---|---|
| 1, 2 | ආපසු ලබා ගැනීම හා නැවත භාවිතය අවශ්‍ය නොවේ. | අලුත් පොත් සපයනු ලැබේ. |
| 3, 4, 5 | 3, 4 ශ්‍රේණිවල ආගම විෂය පෙළපොත් සියල්ල එම ශ්‍රේණියට අදාළ වර්ෂයේ තෙවන වාරය අවසානයේ භාර ගත යුතු වේ.<br>3, 4 ශ්‍රේණිවල භාර නොගත් ඉතිරි පොත් හා 5 ශ්‍රේණියේ සියලු පොත් (වැඩපොත් හැර) 5 ශ්‍රේණියට අදාළ වර්ෂයේ තෙවන වාරය අවසානයේ දී ආපසු ලබා ගත යුතු ය. | 35% |
| 6, 7, 8, 9 | තෙවන වාරය අවසානයේ දී වැඩ පොත් හැර සියලු ම පෙළපොත් ආපසු ලබා ගත යුතු ය. | 60% |
| 10, 11 | 10 ශ්‍රේණියේ දී පෙළපොත් ආපසු ලබා නොගත යුතු ය.<br>10 ශ්‍රේණියේ පෙළපොත් ද 11 ශ්‍රේණියේ පෙළපොත් සමගින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසානයේ දී ආපසු ලබා ගත යුතු ය.<br><br>අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි කිසියම් සිසුවකු යම් විෂයකට නැවත පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් එම විෂයට අදාළ පෙළපොත් ආපසු ලබා නොගත යුතු ය. සාමාන්‍ය පෙළ විභාගයේ සියලු ම විෂය සඳහා නැවත පෙනී සිටින්නේ නම් එවිට ද පෙළපොත් ආපසු ලබා නොගත යුතු ය. | 40% |
| 12, 13 | සාමාන්‍ය ඉංග්‍රීසි පොත උසස් පෙළ විභාගය අවසානයේ දී ආපසු ලබා ගත යුතු ය. | 60% |

04. නැවත භාවිතය සඳහා සුදුසු පෙළපොත් තෝරා ගැනීම.

4.1 පිටු ඉරී/ කොන් නැමී/ පිටු ගැලවී ඇති හෝ පිටකවරය ඉරී/ ගැලවී ඇති හෝ පිටුවල සටහන් යොදා/ කොටස් කපා ඉවත් කර ඇති පෙළපොත් නැවත භාවිතයට නොගත යුතු ය.

4.2 කෙසේ වුව ද සමස්ත තත්ත්වය අනුව යම් පොතක් නැවත භාවිත කිරීමට සුදුසු බව පෙළපොත් භාර ගුරුභවතුන්ට හැඟී යන්නේ නම් එම පොත් නැවත භාවිතයට ගත යුතු වේ.

05. සිසුන්ට පෙළපොත් නිකුත් කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

5.1 කිසිදු අවස්ථාවක කිසිදු සිසුවෙකුට දෙන පොත් සියල්ල භාවිත කළ පොත් නොවීම.
5.2 සියලු ම සිසුන් සමාන ලෙස සලකා භේදයකින් තොරව නව හා භාවිත කළ පෙළපොත් සුදුසු පරිදි මිශ්‍රව ලබා දීමට පියවර ගැනීම.

06. පෙළපොත් පරිහරණය කිරීම පිළිබඳ ව පහත කරුණු සම්බන්ධයෙන් සිසුන් දැනුවත් කළ යුතු ය.

6.1 පෙළපොත්වල සටහන් තැබීම, වර්ණ ගැන්වීම නොකළ යුතු බව
6.2 රූප සටහන් කපා ඉවත් නොකළ යුතු බව
6.3 පිටු ගලවා ඉවත් කිරීම, නැවීම, ඉරා දැමීම නොකළ යුතු බව
6.4 පෙළපොත් සුරක්ෂිත වන ලෙස පාසල් බෑගයේ පොත් අසුරා ගත යුතු බව
6.5 පෙළපොත් සුරක්ෂිත වන ලෙස පිටකවර යොදා භාවිත කළ යුතු බව

07. මෙම ක්‍රියාදාමය සම්බන්ධයෙන් විදුහල්පතිවරයාගේ අධීක්ෂණය යටතේ පෙළපොත් භාර ගුරුවරයා හා පන්ති භාර ගුරුවරයා සිය වගකීම කැපවීමෙන් ඉටු කළ යුතු අතර අදාළ වාර්තා හා සංඛ්‍යා ලේඛන (පොත් ලැබීම් හා නිකුත් කිරීම්) සී.ආර් පොතක් හෝ ලිපි ගොනුවක් මගින් නිවැරදිව පවත්වා ගත යුතු ය. පෙළපොත් භාවිතය පිළිබඳව අධීක්ෂණය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්, කලාප අධ්‍යාපන කාර්යාලයෙන්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් නිලධාරීන් පැමිණි විට අදාළ ලේඛන හා වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

08. විෂයමාලා වෙනස් වීමෙන් හෝ භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වීමෙන් හෝ ඉවත් කරන ලද පෙළපොත් 2014.02.20 දිනැති අංක 2014/01 හා 2017.01.30 දිනැති අංක 2014/01(i) දරන අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු චක්‍රලේඛවල විධිවිධාන අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතු ය.

09. මෙම පෙළපොත් නැවත භාවිත කිරීමේ ක්‍රියාදාමය මගින් හුදෙක් මහජන මුදල් ඉතිරි කර ගැනීම පමණක් ම නොව සිසුන් තුළ සම්පත් අරපරෙස්සමින් භාවිතය, පරිත්‍යාගශීලීත්වය වැනි යහපත් ආකල්ප වර්ධනය ද අපේක්ෂා කරනු ලැබේ.

10. පෙළපොත් නැවත භාවිත කිරීමේ කාර්යභාරයෙහි මූලික වගකීම විදුහල්පතිවරුන්/ පරිවේණාධිපතිවරුන් වෙත මෙයින් පවරමි. එම කටයුතු ජාතික මට්ටමින් අධීක්ෂණය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් ද පළාත් මට්ටමින් අධීක්ෂණය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ද කලාප මට්ටමින් අධීක්ෂණය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ද සිදු විය යුතු ය.

11. පෙළපොත් නිසියාකාරව භාවිත කර ආපසු ලබාදීම පිළිබඳව සිසුන් ඇගයීම හා එම කාර්යය නිසි පරිදි සම්බන්ධීකරණය හා නියාමනය පිළිබඳව ගුරු ඇගයීම සඳහා ක්‍රමවේද පළාත්, කලාප හා පාසල් මට්ටමින් වාර්ෂිකව ක්‍රියාත්මක කළ යුතු වේ.

12. පෙළපොත් නැවත භාවිත කිරීමේ ක්‍රියාවලිය ජාතික වැදගත්කමකින් යුත් ඵලදායී කර්තව්‍යයක් සේ සලකා සාර්ථක කර ගැනීමට අවශ්‍ය පූර්ණ සහයෝගය ලබා දෙනු ඇතැයි උදක් ම අපේක්ෂා කරමි.

13. පෙළපොත් නැවත භාවිතය සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති සියලු ම චක්‍රලේඛ මෙයින් අවලංගු වේ.

එම්. එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය